# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/44 – 2013 පෙබරවාරි 01 වැනි සිකුරාදා – 2013.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 81 බී තෙල්බැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙල්බැද්ද ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/BDL/2008/404 හා 2011.05.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.3673 ක් පමණ වන ඉඩම් කොටස් දෙක (02) සඳහා මායිම්.

01. කැබලි අක්ෂර 'ඒ' – තෙල්බැද්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2851 ක් පමණ

උතුරට: මාර්ගය; නැගෙනහිරට: තෙල්බැද්ද වත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී හා මාර්ගය; බටහිරට: මාර්ගය.

02. කැබලි අක්ෂර 'බී' – තෙල්බැද්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0822 ක් පමණ

උතුරට: කැබලි අක්ෂර ඒ හා තෙල්බැද්ද වත්ත; නැගෙනහිරට: තෙල්බැද්ද වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය හා කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2008/එච්/187.
2012 දෙසැම්බර් මස 11 වැනි දින,
අංක 1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 335


1A – G 171891 – 345 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

සැ.යු.– මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කල හැක.